කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

## පුරවැසි අධ්‍යාපනය

6 ශ්‍රේණිය

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) පාසල් ඉතිහාසය අධ්‍යයනයේ දී උපයෝගී කරගත හැකි මූලාශ්‍රයක් නොවන්නේ

i. පාසලේ ඇති සමරුඵලක
ii. පාසලේ පවතින ලිපිලේඛන
iii. ආදි ශිෂ්‍යන්ගෙන් ලද තොරතුරු
iv. පුස්තකාලයේ ඇති පොත්පත්

02) පාසලේ ප්‍රධානියාට හිමිවන ප්‍රධාන කාර්යයක් වන්නේ

i. අධ්‍යයන කටයුතුවල නියමුවා ලෙස කටයුතු කිරීම
ii. නීතිරීති රෙගුලාසි පිළිබඳ දෙපාර්තමේන්තුවට වගකීම
iii. ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය කිරීම
iv. ගුරු ඇගයීම් කටයුතුවල නිරතවීම

03) පාසල් සංවිධානය තුළ ඇති වෙනත් සංවිධාන අතුරින් පරිපාලන කටයුතු සඳහා මූලිකත්වය ලබාදෙන්නේ,

i. පාසල් කළමනාකරණ කමිටුව
ii. ආගමික කමිටුව
iii. බාලදක්ෂ කමිටුව
iv. සුබසාධක කමිටුව

The National e-Learning Portal for The General Education

04) සැලසුම් සහගත ශිෂ්‍යයෙකු තුළ තිබිය යුතු ලක්ෂණයකි

i. ක්‍රමානුකූලව කටයුතු කළ ද අත්‍යවශ්‍ය අවස්ථා අත්හරී
ii. පසුතැවීමට ඇති අවස්ථා වැඩිකර ගනිමින් තම අරමුණු ඉටුකරගනියි.
iii. පහසුවෙන් අභියෝග ජයගනිමින් වැඩ කල් නොදමයි
iv. අභියෝගවලට මුහුණදීම අපහසු වුව ද ආතතියෙන් තොර වෙයි

05) පාසල තුළින් මිනිස් ප්‍රජාවට ලබාදෙන පණිවුඩයක් නොවන්නේ

i. යහපත් සෞඛ්‍ය පුරුදුවලට හුරු කිරීම
ii. දරුවන් පාසල් යැවීම වැදගත් නොවන බව
iii. පරිසරය සුරැකීමේ වැදගත්කම
iv. නිසි පෝෂණය පිළිබඳ වැදගත්කම

06) ළමා මිතුරු පාසලක ප්‍රධාන ලක්ෂණයකි

i. ළමයා කේන්ද්‍රකරගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් නොවීම
ii. පාසල් කළමනාකරණයේදී ප්‍රජා සහභාගීත්වය ලබා නොගැනීම
iii. ප්‍රබෝධමත් වුව ද සුරක්ෂිත පංති කාමරයක් නොවීම
iv. සිසු උපකාරීත්වය සඳහා ගුරුවරුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය වෙනස් කිරීම

## 2 - කොටස

- සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

01. පාසල් ඉතිහාසය යනු කුමක්දැයි කෙටියෙන් ලියන්න.

02. පාසල් සංවිධාන ව්‍යුහය තුළ ශිෂ්‍යයන් සම්බන්ධ වන ආකාර දෙකක් ලියන්න.

03. පුද්ගලයෙකුගේ දක්ෂතා වැඩිදියුණු කරගැනීම සඳහා යොදාගත හැකි ක්‍රමවේද දෙකක් ලියන්න.

04. ඉගෙනුම් කටයුතුවල නිරතවීමේදී ශිෂ්‍යයෙකු ලෙස ඔබට මුහුණ දීමට සිදුවන අභියෝග දෙකක් ලියන්න.

(ලකුණු 2 x 4 = 8)

05. ශිෂ්‍යයෙකු ලෙස ඉලක්ක ජයගැනීම සඳහා ඔබට ගතහැකි ක්‍රියාමාර්ග 03 ක් ලියන්න.

06. සැලසුම්කරණය හා සංවිධානය නිසා අත්වන වාසි 03 ක් ලියන්න.

07. සමාජයෙන් පාසලට සැලසෙන සේවා 03 ක් ලියන්න.

08. පාසල් සංවර්ධන කමිටුවට අයත් නියෝජිතයන් තිදෙනෙකු නම් කරන්න.

(ලකුණු 3 x 4 = 12)